**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025.12.10

ආචාර්ය හර්ෂණ සූරියපෙරුම,
භාණ්ඩාගාර ලේකම්,
මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.

<u>ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සවි බල ගැන්වීමේ වැඩසටහන සම්බන්ධවයි.</u>

දිට්වා සුළි කුණාටුව සමග ඇතිවූ අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් පැන නැගුණු හදිසි ආපදා තත්ත්වය මත 2025.12.05 දින නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ අංක 08/2025 හා බැදේ.

මෙම චක්‍රලේඛය මගින් බිඳ වැටී ඇති ජන ජීවිතය කඩිනමින් යථාවත් කිරීම සඳහා බොහෝ ක්ෂේත්‍රයන් හා පුද්ගල කණ්ඩායම් ආවරණය කරමින් සහන සලසා තිබීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රසාදය පළකර සිටිමු. එහෙත් මෙම චක්‍රලේඛය තුළ ආබාධ සහිත පුද්ගලය කණ්ඩායම් පිළිබඳව නිසි අවධානයක් යොමු වී නොමැති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

ආබාධ සහිත තැනැත්තන්ට සාමාන්‍ය තැනැත්තන්ට වඩා, එකී ආබාධ තත්ත්වය මත විශේෂ ගැටලු හා දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවී ඇති බව පැහැදිලිය. නිවාස, සනීපාරක්ෂක පහසුකම් සැපයීම ආදියේදී ද ඔවුන්ට විශේෂ වියදමක් දැරීමට හා අතිරේක වැයක් කිරීමට සිදුවීමද නොවැළැක්විය හැකිය. එම නිසා මෙම කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් ආබාධ සහිත පුද්ගලයන් සිටින පවුල් සඳහා දීමනාවන් ලබාදීමේදී මෙම කරුණු පාදක කර ගනිමින් කටයුතු කිරීම කළ යුතුව පවතින හෙයින් අදාළ චක්‍රලේඛය ඒ අනුව සංශෝධනය කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

මෙම දැනුම්වත් කිරීම සිදුකරනුයේ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනත ප්‍රකාරව බව කාරුණිකව සලකන්න.

මේනකා හේරත්
ලේකම් (වැඩබලන)
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk